# Cricket Australia's junior development program

**Written by Steven Talevski and Laura Macintosh**



Cameron Ludowyke is one of 12 Multicultural Ambassadors recently named by Cricket Australia as a part of the Commonwealth Bank Multicultural Leadership Program. The program aims to provide migrant communities with a wider range of leadership skills, as well as to recognise the contributions made by these communities to cricket in Australia.

Cameron, who is of Sri Lankan decent, said that he would particularly like to see more Sudanese migrants giving cricket a go. As a student of Sports Education and Development Australia (SEDA), Cameron now sees many young Sudanese migrants taking part in the MILO in2CRICKET program, through his role as a coordinator.

MILO in2CRICKET is Cricket Australia's junior development program, which aims to teach children the basic skills of cricket in a safe and fun environment, along with fostering the development of social skills and friendships. The diverse aspect of the program means that girls are encouraged to participate as well as boys, which is significant for what was once a typically male-dominated sport.

Through his involvement with MILO in2CRICKET, Cameron has also noticed the increasing involvement of girls in the sport, as well as boys from culturally diverse backgrounds.
"There are four girls in the program I take," Cameron said. "They're pretty good!"

Cameron, who took part in a camp at Cricket Australia's Centre of Excellence in Brisbane, said that already being a Multicultural Ambassador has helped develop skills that can be used off the field.

"The leadership program gave me confidence to speak to different people, including young kids," Cameron said.

The Centre of Excellence camp taught the 12 Ambassadors skills including public speaking, listening and leadership techniques, along with traditional on field skills such as batting, bowling and fielding.

The teen from Ringwood East in Melbourne said that he has been able to bring some of the things he learned at the camp back to his local cricket club. Cameron also hopes to keep scoring runs in this upcoming summer of cricket.

ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් අතරින් දෝෂාභියෝග චෝදනා පාර්ලිමේන්තු ඡන්ද විමසීමේදී ඊට පක්ෂව ඡන්දය නොදුන් එකම මන්ත්‍රීවරයා ඔබ. ඔබගේ ස්ථාවරයට හේතු වුණේ මොනවාද?
මේ දෝෂාභියෝගය පාර්ලිමේන්තුවට ඉදිරිපත් ප්‍රජාතන්ත්‍රවාදය යහපත් අන්දමින් ක්‍රියාත්මක වන රටවල පාර්ලිමේන්තුවට මේ වගේ විශේෂිත පුද්ගලයන් කීපදෙනෙක් ඇතුල් කිරීමට සෙනෙට් සභා, රාජ්‍ය සභා වගේ ක්‍රමවේදයන් තියනවා. මේ විදිහට පාර්ලිමේන්තුවට ඇතුල් වෙන අයගේ මූලික වගකීම තියෙන්නේ රටට. එහෙම අය විශ්වාසය

<u>ආණ්ඩුවේ බල ව්‍යාපෘතියේ කේන්ද්‍රිය කටයුත්තක් වූ දෝෂාභියෝග යෝජනාවට අස්සන් නොකළ, එමෙන්ම දෝෂාභියෝග පාර්ලිමේන්තු විවාදයේදී ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ නොකළ ආණ්ඩු පක්ෂයේ එකම එක මන්ත්‍රීවරයා රජීව් විජේසිංහය. ඔහුගේ මේ අභීත ස්වාධීනත්වය සෑම අතකින්ම විශ්මිත එකකැයි කිව හැකිය. එබැවින් මෙවර 'සන්නස' ඔහුගේ හඬ වෙනුවෙන් විශේෂයෙන් ඉඩක් වෙන්කරමින් සිදුකළ සාකච්ඡාවකි මේ.</u>

## අගවිනිසුරුවරියට මූලික යුක්තියවත් ඉෂ්ඨ වුණේ නෑ

### පා.ම. රජීව් විජේසිංහ

කරන්න කලින් ඒ ගැන යමක් දැනගන්න හෝ කතාකරන්න මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් තිබුණේ නැහැ. මේක ගේනකොටත් කවුරුත් දැනගෙන හිටියේ නෑ, කවුද මේක ගෙනාවේ කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වත් මේක දැනගෙන හිටියේ නෑ. එතුමත් කිව්වානේ මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ යෝජනාවක් නෙවෙයි කියලා. මම දන්නේ නෑ පස්සේ හරි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තීරණයක් ගත්තද කියලා මේක ඒ පක්ෂයේ යෝජනාවක් විදිහට සළකන්න. හැබැයි සන්ධානයෙන් නම් ඒවගේ තීරණයක් ගත්තේම නෑ. ඒ නිසා මම හිතන්නේ නැහැ කාටවත් යුතුකමක් තිබුණා කියල මේකට ඡන්දය දෙන්න.

**දෝෂාභියෝග යෝජනාවට අස්සන් කරන්න ඔබට ආරාධනාවක් ලැබුණේ නැත්ද?**
ආරාධනාවක් ලැබුණා. මට කෝල් කරාම මම කිව්වා මම හිතන්නේ නැහැ මේක හොද අදහසක් කියලා. කොහොම වුණාත් මම බලලා තීරණයක් ගන්නම් මට යෝජනාව එවන්න කියලා. එතකොට කිව්වා නෑ නෑ එවන්න බෑ මෙතනට ඇවිල්ලා, බලලා අස්සන් කරන්න කියලා. මම කිව්වා මේ වගේ දේකදි මට එහෙම තීරණයක් ගන්න බෑ. යෝජනාවේ තියෙන්නේ මොනවද කියලා දැනගන්න ඕනේ. ඒවා ගැන ටිකක් හිතන්න ඕනේ කියලා. එහෙම හැකියාවක් නැත්නම් මට අස්සන් කරන්න බෑ කියලා. ඊට පස්සේ ඒ ගැන මට යමක් දැන්නුවේ නෑ.

ඔබ ආණ්ඩු පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙක්. ජාතික ලැයිස්තු සංකල්පය වෙනස් එකක් වුණාත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙන ආකාරය අනුව ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන් කියන්නේ පක්ෂයේ සමීප හිතවතුන්. පක්ෂයේ වැඩවලට විරුද්ධ වෙන්න ඒ අයිතියක් හෝ හැකියාවක් තියනවාද?
ජාතික ලැයිස්තුව කියන්නේ මොකක්ද? ජාතික ලැයිස්තුව තියෙන්නේ සාමාන්‍යයෙන් ඡන්දයෙන් එන්න බැරි, නැත්නම් ඡන්දයෙන් එන්න අකමැති, නමුත් පාර්ලිමේන්තුවේදි රටටත්, ආණ්ඩුවටත් උදව්කළ හැකි, විශේෂ සේවයක් කළ හැකි පුද්ගලයන් පාර්ලිමේන්තුවට යවන්න. ලෝකයේ තැබිය හැකි යෝජනාවක් ගේන කොට, අය-වැය වගේ ආණ්ඩුවේ වැඩ ක්‍රමය ඉදිරියට ගෙන යන යෝජනාවලදී විචාරශීලිව තමන්ගේ පක්ෂයට සහාය දිය යුතුයි. එහෙම නැතිවිට තමන්ට ස්වාධීනව කටයුතු කළ හැකියි. තමන් පාර්ලිමේන්තුවට දාලා තියෙන්නේ ගේන ගේන යෝජනාවලට නිකන් අත උස්සන්න නෙවෙයි. කිසිම පාර්ලිමේන්තුවක එහෙම නෑ.

**දෝෂාභියෝගය සම්බන්ධයෙන් ඔබට තියන ගැටළු මොනවාද?**
දෝෂාභියෝගය විභාග කළ ස්ථාවර නියෝගය සුදුසු නැති ස්ථාවර නියෝගයක්. ඒ ස්ථාවර නියෝගයේ ප්‍රශ්ණ තියනවා. එවැනි වැරදි ස්ථාවර නියෝගයක් යටතේ කටයුතු කරන එක සුදුසු නෑ. අනෙක් එක කමිටුව කියන විදිහට ස්ථාවර නියෝගය අනුව කටයුතු කළා වුණාත් කමිටුව නිවැරදි ලෙස කටයුතු කළේ නෑ. මේ චෝදනා 14 න් දහයක්ම කිසිම තේරුමක් නැති චෝදනා. මුල් චෝදනා හතර විතරයි විමර්ශනයකට සුදුසු තරමේ චෝදනා. ඒ අතරින් ගිණුම් ගැන චෝදනාව විමර්ශණය කිරීම සුදුසු දෙයක් වුණාත් ඒක මේ වගේ කොමිටියකට කරන්න බැරි දෙයක්. චෝදනා විභාග කරනකොට සාක්ෂිකරුවන් කැඳවන බවක් අගවිනිසුරුවරියට කිව්වෙත් නෑ. ඒක වැරදියි. සාක්ෂිකාරයෝ ගේනවනම් ඒ බව කලින් ඇයට දන්වන්න තිබුණා. මම මේ ගැන කිව්වාම කවුරු හරි කෙනෙක් කිව්වා නෑ නෑ ඒක නෙවෙයි හේතුව මෙයා කලින් ඉදලාම ලෑස්තිවෙලා ඉදලා තියෙන්නේ මේ විදිහට කමිටුවෙන් ඉවත්වෙලා යන්න කියලා. ඒක කමිටුව දැනගෙන හිටියා නම් ඒ තත්ත්වය වළක්වා ගන්න වඩා සැළකිලිමත්ව කටයුතු කරන්න තිබුණා. කලින්ම කියලා තිබුණා නම් සාක්ෂිකාරයෝ ගේනවා කියලා එතුමියට ඒ චෝදනාව කරන්න බැරිවෙනවා නේ. මොකද මේක මූලික යුක්තිය නේ. කමිටුව ඒ අයිතිය ඇයට දුන්නේ නැහැ.
කමිටුව ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් කරලා තියනවා වැරදි කළත් නැතත් ඒක නෙවෙයි ප්‍රශ්ණය. ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉන්න කෙනෙක් කිසිසේත් සැකක් ඇතිවෙන විදිහට කටයුතු නොකළ යුතුයි කියලා. ඒක හරි. ඒ වගේම තමයි විමර්ශණ කමිටුව ක්‍රියාකළ යුත්තේත් ඒ විදිහටම තමයි. ඒකත් සිදුවෙලා නෑ. ඒ කියන්නේ මේ ක්‍රමයත් වැරදියි.
ස්ථාවර නියෝගවල ඔබ දකින වැරදි මොනවද?



දැන් තියන ස්ථාවර නියෝග තනිකරම පිස්සුවක්. වැරදි, අඩුපාඩුකම් ගොඩක් තියනවා. තාම ඒකේ තියනවා අනෙක් පුද්ගලයාගේ නමින් කතාකරන්න බැහැ කියලා. ඒක සුදුසු වුණේ ආසන ක්‍රමය යටතේ එක ආසනේකට එක මන්ත්‍රී කෙනෙක් ඉන්න

සාකච්ඡා කළේ
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

කොට. සමානුපාතික ක්‍රමය යටතේ කියන්න බෑනේ මහනුවර දිස්ත්‍රික්කයේ තුන්වෙනි මන්ත්‍රීතුමා කියලා. ඒත් ස්ථාවර නියෝග අනුව නම කියන එකත් වැරදියි. මේ වගේ නිවැරදි කළ යුතු තැන් රාශියක් තියනවා. 2010 කොමිටියක් පත්කළා මේ තියන ස්ථාවර නියෝග සංශෝධනය කරන්න. මාවත් ඒ කොමිටියට දැම්මා. මාස තුනකදි මේ ස්ථාවර නියෝගවලින් හතරෙන් එකක් අපි සංශෝධනය කළා. එතකොට පාර්ලිමේන්තුවේ ඇතුළේ බොහොම පුංචි පරිපාලන ප්‍රශ්ණයක් ඇතිවුණා. ඒකෙන් කොමිටියේ කටයුතු අතරමග ණැවතුනා. මේ වෙනකොට අවුරුදු දෙකයි නැවතිලා. මම ඉල්ලනවා ඉල්ලනවා මහලේකම්ගෙන් මේ වෙනකම් කිසිම දෙයක් වුණේ නෑ. අන්තිමට කතානායකතුමාටත් ලිව්වා.

**ඔබට අධිකරණය ගැන ගැටළු නැත්ද?**
මම තමයි අවුරුද්දක් තිස්සේ ආණ්ඩුවට කිව්වේ ඉහළ අධිකරණත් එක්ක ප්‍රශ්ණ තියනවා කියලා. අපි පිළිගන්නවා තීන්දු දෙනකොට අධිකරණය ස්වාධීන වෙන්න ඕනේ කියලා. ඒ තීන්දු අධිකරණයේ හිතුමතයට දෙන්න බෑ. පවතින නීතිවලට අනුව විය යුතුයි. මේ අධිකරණ හුගාක් අවස්ථාවල ලංකාවේ තියන නීති අනුව නෙවෙයි කටයුතු කරන්නේ. මම කීපවතාවක්ම හිටපු අග්‍රවිනිශ්චයකාරතුමියට මේ ගැන ලිව්වා. ඔයසි සි බදළු" කඍැරියසව මෙබපජළුසදබ කියලා එයාගේ ගෝලයෝ මට උත්තර එවලා තිබුණා. එහෙම නම් කාගේ පන්ක්ෂන් එකද? ඒ වගේම ජනාධිපතිතුමා කැඳවන කොට නොගිය එකත් මම හිතන්නේ ලොකු වරදක්. ඒක දෝෂාභියෝග ගේන්න වරදක් නෙවෙයි. නමුත් එතුමිය නොගිය එක වැරදියි කියලයි මම හිතන්නේ. ඊට පස්සේ ඒගොල්ලන් ප්‍රකාශනයක් නිකුත් කළා අධිකරණයට බලපෑම් තියනවා කියලා. ඒවගේ කටයුතු කරන එක සම්පූර්ණයෙන්ම වැරදියි. ඒ වගේ නොයෙක් නොයෙක් ප්‍රශ්ණ තිබුණා. පැහැදිලිවම ඒවගේ දේවල්වලට විරුද්ධව පියවර ගන්න ඕනේ. නමුත් මම යෝජනා කරන්නේ මේවගේ වැරදි නොවෙන්න අපි ක්‍රම හදන්න ඕනේ කියන එකයි.

**ආණ්ඩුවේ අනපනත්වලටත් අධිකරණයෙන් බාධා එල්ල වුණා නේද? ඔය විදිහට හැසිරෙන අධිකරණයක් එක්ක ඉදිරියට යන්නේ කොහොමද කියලා ආණ්ඩුවට ප්‍රශ්ණයක් ඇතිවෙන එකත් ස්වාභාවිකයි නේද?**
අධිකරණයේ සිදුවුණු මේ දේවල් ආණ්ඩුව ඉදිරියට යන එක වළක්වන්න කළ දේවල් නෙවෙයි. දිවි නැගුම පනත ගැන අධිකරණය දුන්න තීරණ ගැන මුලදි ලොකුවට ප්‍රශ්ණ කළ ඇතැම් ඇමැතිවරුත් පස්සේ පිළිගත්තා, නෑ අධිකරණය දීලා තියන මේ තීන්දු අපි අනුගමනය කළ යුතුයි කියල. ඒ දුන්න තීරණ එක අතකින් නිවැරදියි. මේ තීරණ අධිකරණයෙන් දීපු වෙලාවේ ආණ්ඩු පක්ෂ රැස්වීමෙදි මම නැගිටලා කිව්වා පනත් ඉදිරිපත් කරන කොට අපි ටිකක් ප්‍රවේශම් වෙන්න ඕනේ. මේක තමයි මේවගේ තීන්දුවක් ලැබුණ තුන්වෙනි පනත කියලා. ප්‍රාදේශීය සභා ඡන්ද පනතටත් මේ වගේ ප්‍රශ්ණ ආවේ කෙටුම්පත් කිරීමේ වැරදි නිසා. අනිත් එක පුද්ගලික අංශයට විශ්‍රාම වැටුපක් ගේන්න ගෙනාව පනත. ඒකත් හරියට කළේ නැති නිසා සේරම අවුල් වුණා. ප්‍රවේශමෙන් මේවා කරනවා නම් මෙහෙම වෙන්නේ නෑ.

**පාර්ලිමේන්තුව අධිකරණ නියෝග නොතකා**

41 වන පිටට